රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk Web Site

---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/අන්තර්ග්‍රහණ පොදු විමසීම
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.03.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළකරමින්, මෙතෙක් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය නොවූ නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධවයි .</u>**

අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළකරන ලද මාගේ අංක CS/DOS/Policy/පොදු/01 හා 2021.10.25, 2023.06.02 දිනැති ලිපිවලට වැඩිමනත් වශයෙනි.

02. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීම සඳහා මනාපය පළකරන ලද සියලුම නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කළයුතු අතර, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකර මෙතෙක් අන්තර්ග්‍රහණය වී නොමැති ආශ්‍රිත සේවා ගණයෙහි III ශ්‍රේණියේ තනතුරක සේවය කරනු ලබන නිලධාරීන්හට රු.37,720/- න් ඔබ්බට වැටුප් වර්ධක ලබාදීමේ හැකියාවක් නොපවතින බව යොමුගත 2023.06.02 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

03. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීමට මනාපය පළකරන ලද නිලධාරීන්ගේ ලිපි/ලේඛන මුල් අවස්ථාවේදී (2012 වර්ෂයේදී) ඉදිරිපත් කිරීමෙන් වසර ගණනාවක් ගතව තිබීම නිසාත්, සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණයවීමට නිලධාරීන් මනාපය පළකිරීමෙන් අනතුරුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2010 යටතේ වෙනත් ආයතන වෙත ස්ථාන මාරු වී යාම නිසාත් ඇතැම් නිලධාරීන්ගේ සේවා ස්ථාන සොයා ගැනීමට නොහැකිවීම මත සැළකිය යුතු ප්‍රමාණයක නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති අතර, එම නිලධාරීන්ගේ උසස්වීම්, ස්ථාන මාරු හා විශ්‍රාම ගැන්වීම් යන ආයතනික කටයුතු සිදු කිරීමටද, නොහැකි වී ඇත.

04. ඒ අනුව, යොමුගත 2021.10.25 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති පරිදි මේ වන විට අක්‍රීය තත්වයේ පවතින ගොනු ලෙස ගොනු විශාල සංඛ්‍යාවක් හඳුනාගෙන ඇති බැවින්, ප්‍රකාශයට පත්කර ඇති අක්‍රීය ලිපිගොනු පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පලකර ඇති අතර, එම තොරතුරු වෙත පහත දිගුව මඟින් ප්‍රවේශ විය හැකිය.

https://www.pubad.gov.lk/web/images/contents/cs-services/dos/dos-files-submitted-for-absorbtion-and-inactive-for-more-than-3-years.pdf

05. ඒ අනුව, ඔබ ආයතනයේ සේවය කරන පහත දැක්වෙන කාණ්ඩවලට අයත් නිලධාරීන්ගේ තොරතුරු මෙම ලේඛණයේ පවතීද යන්න පිළිබඳව පරීක්ෂා කරන ලෙස අදාළ විෂයභාර නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.( නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය හා නම භාවිතයෙන්)

- සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළකර තවමත් අන්තර්ග්‍රහණය නොවූ නිලධාරීන්
- රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 16/2010 අනුව වෙනත් රාජ්‍ය ආයතනවලින් ස්ථානමාරු වී පැමිණි නිලධාරීන්
- රාජ්‍ය පරිපාලන 01/2012 අනුව උසස්වීම් පරිපාටිවලට ඇතුළත් නොවූ නිලධාරීන්
- වැටුප් වර්ධක හෝ උසස්වීම්වල ගැටළු පවතින 1994 දින සිට 2011 දක්වා රාජ්‍ය සේවයට බඳවා ගත් නිලධාරීන්

06. මෙවැනි නිලධාරීන් සිටී නම්, අඩුපාඩු ලෙස දක්වා ඇති ලේඛන / තොරතුරු කඩිනමින් මා වෙත යොමු කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.



එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්